අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2008 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2008

ඉතිහාසය I කොටස
History Part I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා

පැය එකයි
One Hour

මෙම කොටසේ ප්‍රශ්න 40ක් ඇත. සියලු ම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි වන්නේ එයින් එකක් පමණි.
ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
මෙම කොටසට ලකුණු 40ක් ලැබේ.
I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.

## I කොටස

○ අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක්දැයි හඳුනාගෙන එහි **අංකය තිත් ඉර** මත ලියන්න.

01. (1) ආර්පාක්කම් ලිපිය (2) පල්ලවරායන් පෙට්ටයි ලිපිය (3) තිරුවාලංගාඩු ලිපිය
(4) විදම්බරම් ලිපිය (5) රාමේශ්වරම් ලිපිය (......)

02. (1) පුලහත්ථ (2) පිළියමාර (3) බාහිය
(4) භල්ලුක (5) පණයමාර (......)

03. (1) දකපති (2) සුංගම් (3) දකබක
(4) මහෙර මජ්ඣිකපති (5) උදකපති (......)

04. (1) කඳවුරු නුවර (2) ජනනාථපුරම් (3) නයිනතිව්
(4) ජනනාථමංගලම් (5) පුලස්ති නගර (......)

05. (1) නියම්ගම්පාය (2) දැදිගම කොටවෙහෙර (3) තිවංක පිළිමගේ
(4) උත්තරාරාමය (5) දෙමළ මහා සෑය (......)

06. (1) විදෝර් ද පසෙන්දා (2) ඔව්දෝර් (3) ඔන් ද කුප්මන්
(4) ඔපර් කුප්මන් (5) කපිතාන් ජෙනරාල් (......)

07. (1) දන්තුරේ සටන (2) බලන සටන (3) වෙල්ලස්ස සටන
(4) රන්දෙනිවල සටන (5) ගන්නොරුව සටන (......)

08. (1) අතුකෝරාළ (2) මහ මොහොට්ටාල (3) මහ ගබඩා නිළමේ
(4) හළුවඩන නිළමේ (5) දියවඩන නිළමේ (......)

09. (1) බූටෑවේ රාළ (2) මොල්ලිගොඩ (3) කැප්පෙටිපොළ
(4) මඩුගල්ලේ (5) කිවුලේගෙදර (......)

10. (1) කෝල්බෲක් (2) කැමරන් (3) බ්‍රවුන්ඩ් මිල්ස්
(4) ඩොනමෝර් (5) ටෙනන්ට් (......)

○ අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **ගැළපේ. එම නො ගැළපෙන** යුගලය කුමක් දැයි හඳුනාගෙන ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

11. (1) උපතිස්සගාම - කදම්බ නදී (2) උරුවෙලගාම - ගෝණ නදී
(3) කාචරගාම - කප්පකන්දර නදී (4) විජිතගාම - මහාවාලුකා නදී
(5) දීඝගාම - කල්‍යාණ නදී (......)

12. (1) පණ්ඩුකාභය - ස්වර්ණපාලි (2) බල්ලාටනාග - අනුලා දේවි
(3) නිශ්ශංකමල්ල - සුගලා දේවි (4) වට්ටගාමණී - සෝමා දේවි
(5) මහාදාඨික මහානාග - දමිළ දේවි (......)

13. (1) වාකිරිගල - වීරමල්ල
(2) ගෝවින්දමල - භුවනෙකබාහු ආදිපාද
(3) යාපහුව - සුබ සෙනෙවි
(4) මීඝිපේ - සංඛ සෙනෙවි
(5) දඹදෙණිය - විජයබාහු (......)

14. (1) ලොරෙන්සෝ ද අල්මේදා - පෘතුගීසි (2) ස්පිල්බර්ජන් - ස්පාඤ්ඤ
(3) ද ලැනරෝල් - ප්‍රංශ (4) සීබෝල්ට් ද වාර්ට් - ලන්දේසි
(5) ජෝන් පයිබස් - ඉංග්‍රීසි (......)

15. (1) සිල්වත් සමාගම - වැලිවිට සරණංකර හිමි
(2) බෞද්ධ පරම විඥානාර්ථ සමාගම - එච්.එස්.ඕල්කොට්
(3) මහාබෝධි සමාගම - අනගාරික ධර්මපාල
(4) රාමකෘෂ්ණ සභාව - නටේසර් අයියර්
(5) ශෛව ප්‍රගාස සභා - ආරුමුග නාවලර් (......)

○ අංක 16 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දක්වා ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නො වේ. X තීරුව, Y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා තිත් ඉර මත ලියන්න.

16.
| | X | | Y |
|---|---|---|---|
| (i) | වැම් ලිපිය | A | පනාකඩුව |
| (ii) | ගිරි ලිපිය | B | හෝපිටිගම |
| (iii) | පුවරු ලිපිය | C | දඹදෙණිය |
| (iv) | කතිකාවත | D | දදිගම |
| (v) | සන්නස | E | අම්පිටිය |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

17.
| | X | | Y |
|---|---|---|---|
| (i) | කුරුන්ද වාපි | A | II මොග්ගල්ලාන |
| (ii) | ගංගාතට වාපි | B | I අග්ගබෝධි |
| (iii) | මණිහීර වාපි | C | මහාසේන |
| (iv) | බුද්ධගුණ වාපි | D | II අග්ගබෝධි |
| (v) | පත්තපාසාණ වාපි | E | I විජයබාහු |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

18.
| | X | | Y |
|---|---|---|---|
| (i) | සූරතිස්ස | A | කරිකාල චෝළ |
| (ii) | වංකනාසික තිස්ස | B | සේන සහ ගුත්තික |
| (iii) | I සේන | C | I රාජරාජ |
| (iv) | IV උදය | D | ශ්‍රී මාර ශ්‍රී වල්ලභ |
| (v) | V මහින්ද | E | I පරන්තක |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

19.
| | X | | Y |
|---|---|---|---|
| (i) | යාපහුව | A | විජය කුළුත්තෙක චක්‍රවර්ති |
| (ii) | යාපනය | B | I භුවනෙකබාහු |
| (iii) | දඹදෙණිය | C | IV භුවනෙකබාහු |
| (iv) | කුරුණෑගල | D | II භුවනෙකබාහු |
| (v) | ගම්පොළ | E | III විජයබාහු |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)


Past Papers Wiki

| 20. | X | | Y |
|---|---|---|---|
| (i) | සීලවංස ධම්මකිත්ති හිමි | A | සද්ධර්මාලංකාරය |
| (ii) | ජයබාහු ධම්මකිත්ති හිමි | B | පාරමී මහාශතකය |
| (iii) | රාජගුරු ධම්මකිත්ති හිමි | C | සරජෝතිමාලෙ |
| (iv) | ධම්මදින්න විමලකිත්ති හිමි | D | දුඨාවංශය |
| (v) | තේනුවරෙයි පෙරුමාල් | E | සද්ධර්මරත්නාකරය |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

| 21 | X | | Y |
|---|---|---|---|
| (i) | ජාකොම් ගොන්සාල්වේස් පියතුමා | A | සිංහලේ ආණ්ඩු ක්‍රමය |
| (ii) | පිලිප්පුස් බැල්දියස් | B | දේවවාද පුරාණය |
| (iii) | ෆර්නාවෝ ද ක්වේරෝ | C | ලංකාවේ පනස් වසක් |
| (iv) | තෝමස් ස්කිනර් | D | ලංකා විස්තරය |
| (v) | ජෝන් ඩොයිලි | E | ලංකා ආධිපත්‍යය. |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

| 22 | X | | Y |
|---|---|---|---|
| (i) | 1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රමය | A | සර්වජන ඡන්දබලය හඳුන්වා දීම. |
| (ii) | 1910 කෲ - මැකලම් ආණ්ඩුක්‍රමය | B | ව්‍යවස්ථාදායක සභාවේ ආරම්භය |
| (iii) | 1920 මැනිං ආණ්ඩුක්‍රමය | C | කැබිනට් ක්‍රමය හඳුන්වා දීම. |
| (iv) | 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය | D | පළාත් බද නියෝජන ක්‍රමය ආරම්භ කිරීම. |
| (v) | 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය | E | ජනවාර්ගික නියෝජනය අවලංගු කිරීම. |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

| 23. | X | | Y |
|---|---|---|---|
| (i) | 1797 මුහුදුබඩ කැරැල්ල | A | රොබට් බ්‍රවුන්රිග් |
| (ii) | 1817-1818 නිදහස් අරගලය | B | ද මියුරන් |
| (iii) | 1848 බ්‍රිතාන්‍ය විරෝධී සටන | C | රොබට් චාර්මස් |
| (iv) | 1883 කොටහේන කෝලාහලය | D | ජේම්ස් ලොංඩන් |
| (v) | 1915 කෝලාහල | E | ටොරිංටන් සාමි |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

| 24. | X | | Y |
|---|---|---|---|
| (i) | මධ්‍යම පළාත | A | 1848 |
| (ii) | වයඹ පළාත | B | 1833 |
| (iii) | උතුරු මැද පළාත | C | 1889 |
| (iv) | ඌව පළාත | D | 1873 |
| (v) | සබරගමු පළාත | E | 1886 |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

| 25. | X | | Y |
|---|---|---|---|
| (i) | ව්‍යවස්ථාදායක මණ්ඩලයේ ප්‍රථම සිංහල මන්ත්‍රීවරයා | A | එන්.එම්. පෙරේරා |
| (ii) | ව්‍යවස්ථාදායක මණ්ඩලයේ ප්‍රථම උඩරට මන්ත්‍රීවරයා | B | පිලිප්ස් විජේකෝන් පණ්ඩිතරත්න |
| (iii) | ව්‍යවස්ථාදායක මණ්ඩලය තුළ උගත් ලාංකිකයන්ගේ ප්‍රථම නියෝජිතවරයා | C | ඩී.බී. ජයතිලක |
| (iv) | රාජ්‍ය මන්ත්‍රණ සභාවේ පළමුවන සභානායක | D | ටී.බී. පානබොක්කේ |
| (v) | පාර්ලිමේන්තුවේ පළමුවන විරුද්ධ පක්ෂ නායකයා | E | පොන්නම්බලම් රාමනාදන් |

(1) BADEC (2) BAEDC (3) BDCEA (4) BDECA (5) BEDCA (......)

Past Papers Wiki

○ අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය.** නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

(A) සහ (B) පමණක් නිවැරදි නම් ............................................................ 1 ද,

(B) සහ (C) පමණක් නිවැරදි නම් ............................................................ 2 ද,

(C) සහ (D) පමණක් නිවැරදි නම් ............................................................ 3 ද,

(A) සහ (C) පමණක් නිවැරදි නම් ............................................................ 4 ද,

ප්‍රතිචාර **එකක්** හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් .............. 5 **ද, තිත් ඉර මත ලියන්න.**

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

26. පැරණි ශ්‍රී ලංකාවේ ඓතිහාසික සම්ප්‍රදාය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) ශ්‍රී ලංකා ඉතිහාස සම්ප්‍රදාය ආරම්භ වූයේ බුද්ධාගම හඳුන්වා දීමත් සමඟ ය.
   (B) මෙම ඉතිහාස සම්ප්‍රදායේ දනට ඉතිරි වී තිබෙන පුරාණතම වාර්තාව වන්නේ දීපවංසයයි
   (C) ඉතා ප්‍රකට වංශකථාව වූයේ මහාවංසයයි.
   (D) වංසත්ථප්පකාසිනිය දීපවංසයට ලියන ලද අටුවා ග්‍රන්ථයයි. (......)

27. ශ්‍රී ලංකාවේ බුද්ධාගමේ ඉතිහාසය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
   (A) ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට බුද්ධාගම ප්‍රචාරය කරනු ලැබුවේ මිහිඳු මහ තෙරුන් වහන්සේ විසිනි.
   (B) වට්ටගාමණී රජු තමන් සැඟවී සිටිය දී උපකාර කළ කුපික්කල තිස්ස හිමිට අභයගිරි විහාරය පූජා කළේ ය.
   (C) මහාවිහාරය සාගලික නිකායේ මූලස්ථානය විය.
   (D) ජෙට්ඨතිස්ස රජු විසින් ජේතවන විහාරය පිහිටුවන ලදී. (......)

28. අනුරාධපුර රාජධානියේ බිඳ වැටීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර සාධකය / සාධක නිවැරදි වේ ද?
   (A) කාලිඞ්ග පාණ්ඩ්‍ය ආරවුල
   (B) චන්ද්‍රභානුගේ ආක්‍රමණය
   (C) දුර්වල පාලකයින්
   (D) පොළොන්නරුව වැදගත් වීම. (......)

29. හයවන පරාක්‍රමබාහු රජුගේ පාලන කාලය හා සම්බන්ධයෙන් පහත සඳහන් කවර කාරණය / කාරණා නිවැරදි වේ ද?
   (A) මහනුවර රාජධානියේ අගනගරය බවට පත් වීම.
   (B) ශ්‍රී ලංකාව එක්සේසත් කළ අවසාන පාලකයා වීම.
   (C) යාපා පටුන ජයගැනීම.
   (D) පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීම. (......)

30. 1848 නැගී සිටීම හා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රතිචාරය / ප්‍රතිචාර නිවැරදි වේ ද?
   (A) 1848 නැගී සිටීමට තුඩුදුන් ආසන්න ම හේතුව වූයේ ටොරිංටන් ආණ්ඩුකාරයා විසින් හඳුන්වා දෙන ලද බදු ය.
   (B) එම සටනේ නායකත්වය දැරුවේ ගොන්ගාලේගොඩ බණ්ඩා සහ පුරන් අප්පු ය.
   (C) සටන ආරම්භයේ දී ගොන්ගාලේගොඩ බණ්ඩා ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් මාතලේ අලුවිහාරයේ දී ඔටුනු පැළඳී ය.
   (D) කඩහපොල සහ ගිරාණේගම යන භික්ෂූහු සටන්කාමීන්ට සහාය දැක්වූ හ. (......)

○ අංක 31 සිට 35 තෙක් සෑම ප්‍රශ්නයක ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට **නොගැළපේ. එම නොගැළපෙන** කරුණ තෝරා එහි **අංකය තිත් ඉර මත** ලියන්න.

31. පළමුවන පරාක්‍රමබාහු රජුගේ විදේශ සම්බන්ධතා
   (1) බුරුම ආක්‍රමණය
   (2) දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය දේශයට කළ ආක්‍රමණය
   (3) කාම්බෝජය සමඟ මිත්‍ර සම්බන්ධතා
   (4) අග්නිදිග ආසියාතික රටවල් සමඟ ආගමික සම්බන්ධතා
   (5) චීනය සමඟ වෙළඳ සම්බන්ධතා (......)

32. නායක්කර් පෙළපත
   (1) ප්‍රථම පාලකයා විජය රාජසිංහ රජු ය.
   (2) නායක්කර් පෙළපතේ රජවරු දකුණු ඉන්දීය පවුල් සමඟ විවාහ සම්බන්ධතා තවදුරටත් පැවැත්වූහ.
   (3) කීර්ති ශ්‍රී රාජසිංහ රජු බුද්ධාගමේ සහ බෞද්ධ සංස්කෘතියේ ශ්‍රේෂ්ඨ අනුග්‍රාහකයෙකි.
   (4) අවසාන නායක්කර් පාලකයා වූයේ නරේන්ද්‍රසිංහ රජු ය.
   (5) රාජාධි රාජසිංහ රජුගේ පාලන සමයේ දී බ්‍රිතාන්‍යයන් විසින් මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කරගනු ලැබී ය. (......)

33. සීතාවක රාජධානියේ බලවර්ධනයේ ප්‍රධාන අවස්ථා
   (1) 1521 දී විජයබාකොල්ලය.
   (2) 1538 දී මායාදුන්නේ විසින් රයිගම සීතාවක රාජ්‍යයට ඈඳාගනු ලැබීම.
   (3) 1582 දී රාජසිංහ රජු විසින් උඩරට ප්‍රදේශ අල්ලාගනු ලැබීම.
   (4) 1562 දී පෘතුගීසීන්ට විරුද්ධ ව මුල්ලේරියා සටන ජය ගැනීම.
   (5) 1604 දී යාපනය යටත් කර ගැනීම. (......)

34. ලන්දේසීන් සහ උඩරට රජුන් අතර පැවති සම්බන්ධතා
   (1) 1602 දී ලන්දේසින් පළමුවන විමලධර්මසූරිය රජු හමුවීම.
   (2) ලන්දේසීන් උඩරට රාජධානිය ආක්‍රමණය කිරීම සහ 1766 ගිවිසුම
   (3) ලන්දේසීන් උඩරට රාජධානිය අල්ලා ගැනීම.
   (4) 1638 ගිවිසුම
   (5) සියමෙන් උපසම්පදාව ගෙන ඒම සඳහා ලන්දේසීන් උඩරට රජතුමාට සහයෝගය දැක්වීම. (......)

35. දහනව වන සියවසේ ඇති වූ බෞද්ධ පුනර්ජීවනය
   (1) බෞද්ධ පරම විඥානාර්ථ සමාගම ආරම්භ කිරීම.
   (2) උපසම්පදාව යළි පිහිටු වීම.
   (3) බෞද්ධ අධ්‍යාපනය දියුණු වීම.
   (4) බෞද්ධ කොඩිය සකස් කිරීම.
   (5) වෙසක් පෝය දිනය රජයේ නිවාඩු දිනයක් බවට ප්‍රකාශ කිරීම. (......)

○ අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලදැ'යි තෝරා ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.

| පළමුවැනි ප්‍රකාශය | | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2. | නිවැරදි ය. | වැරදි ය. |
| 3. | වැරදි ය. | වැරදි ය. |
| 4. | වැරදි ය. | නිවැරදි ය. |
| 5. | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|
| 36. දැදිගම කොට වෙහෙර මහා පරාක්‍රමබාහු රජු විසින් කරවන ලදී. | දෙමළ සිරකරුවන් යොදා පොළොන්නරුවේ දෙමළ මහා සෑය ඉදි කෙරිණ. | (......) |
| 37. පොළොන්නරුවේ සිට මුළු දිවයින ම පාලනය කළ අවසාන පාලකයා වූයේ නිශ්ශංකමල්ල රජු ය. | නිශ්ශංකමල්ල රජු රාමඤ්ඤ දේශයට හමුදාවක් යැවී ය. | (......) |
| 38. උඩරට රාජ්‍යයේ පරිපාලන ඒකක 21 ක් තිබිණ. | 1594 දී I විමලධර්මසූරිය රජුගෙන් ආරම්භ වූ උඩරට සිංහල රාජවංශය 1815 දී ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඉංග්‍රීසීන් යටතට පත්වීමත් සමඟ ම අවසන් විය. | (......) |
| 39. ලන්දේසීහු සිය ආගම ප්‍රචාරය කිරීම සඳහා ජේසුයිට් මිෂනාරිවරුන් යොදා ගත්හ. | ක්වේරෝස් ශ්‍රී ලංකාවේ මිෂනාරි කටයුතුවල යෙදී සිටි කතෝලික පූජකවරයෙකි. | (......) |
| 40. වැවිලි කර්මාන්තයේ ව්‍යාප්තිය හා ප්‍රවාහන ක්‍රමයේ වර්ධනය අතර අන්‍යෝන්‍ය සබඳතාවක් පවතී. | දහනව වන සියවස තුළ වැවිලි කටයුතුවල අවශ්‍යතාවලට ප්‍රතිචාර වශයෙන් රජය විසින් මහාමාර්ග හා දුම්රියමාර්ග ගොඩනංවන ලද අතර එම මාර්ග කෝපි වගාව නව ප්‍රදේශ කරා ව්‍යාප්ත කරවීමට සමත් විය. | (......) |

PAST PAPERS WIKI

Past Papers Wiki

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2008 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2008

ඉතිහාසය I කොටස
History Part I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා

පැය දෙකයි
Two Hours

10 වන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න
ප්‍රශ්න අංක 10ට පිළිතුරු සැපයීම සඳහා ලංකාවේ දළ සිතියමක් සපයා ඇත

## II කොටස

01. රජරට ශිෂ්ටාචාරය හැඩගැස්වීමෙහි ලා පහත සඳහන් භූගෝලීය සාධක බලපෑ ආකාරය පැහැදිලි කරන්න.
    (i) ස්වාභාවික වරායයන් (ii) මධ්‍යම කඳුකරය
    (iii) ගංගා පද්ධතිය (iv) තැනිතලා ප්‍රදේශ (ලකුණු 14 යි)

02. අනුරාධපුරය අගනුවර කොට ගත් රාජධානියක් පිහිටුවීමෙහි ලා පණ්ඩුකාභය විසින් ඉටු කරන ලද කාර්යභාරය පරීක්ෂා කරන්න. (ලකුණු 14 යි)

03. "අනුරාධපුර යුගයේ වාරිමාර්ග පද්ධතිය පැරණි ශ්‍රී ලංකා ශිෂ්ටාචාරයේ ශ්‍රේෂ්ඨතම දායාදයයි." මේ කියමන සාකච්ඡා කරන්න. (ලකුණු 14 යි)

04. ශ්‍රී ලංකාව විදේශ ආධිපත්‍යයෙන් මුදවා ගැනීමේ දී දුටුගැමුණු සහ පළමුවන විජයබාහු යන රජවරුන් දෙදෙනාට මුහුණ දීමට සිදු වූ අභියෝග සහ ඔවුන් ඒවා ජයගත් අන්දම සංසන්දනාත්මක ව සාකච්ඡා කරන්න. (ලකුණු 14 යි)

05. පෘතුගීසීන් ලංකාවේ නිරිතදිග ප්‍රදේශවල ස්වකීය පාලන ක්‍රමය සංවිධානය කිරීමේ දී කෝට්ටේ රාජ්‍යයේ පැවැති පාලන ක්‍රමය කෙතෙක් දුරට උපයෝගී කරගත්තේද'යි පරීක්ෂා කරන්න. (ලකුණු 14 යි)

06. "පෘතුගීසීන් පලවා හැරීමට පමණක් නොව ලන්දේසි බලය මෙල්ල කිරීමට ද සමත් වූ බැවින් දෙවන රාජසිංහ රජු ශ්‍රේෂ්ඨ පාලකයකු ලෙස සැලකිය හැකි ය." මේ කියමන සාකච්ඡා කරන්න. (ලකුණු 14 යි)

07. "උඩරට රාජ්‍යයේ බිඳ වැටීම ශ්‍රී ලංකාවේ ජාතික ස්වාධීනත්වයේ අවසානය සලකුණු කරයි."
    (i) උඩරට රාජ්‍යයේ අවසාන රජු නම් කරන්න. (ලකුණු 01 යි)
    (ii) ඉංග්‍රීසීන්ට සහාය දක් වූ උඩරට ප්‍රධානීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02 යි)
    (iii) 1815 දී උඩරට රාජ්‍යය ඉංග්‍රීසීන් විසින් යටත් කර ගනු ලැබීමට තුඩු දුන් සාධක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)
    (iv) උඩරට රාජ්‍යයේ අභ්‍යන්තර තොරතුරු ලබාගැනීම සඳහා රහස් ඔත්තු සේවාවක් මෙහෙය වූ බ්‍රිතාන්‍ය නිලධාරියා නම් කරන්න. (ලකුණු 02 යි)
    (v) 1815 උඩරට ගිවිසුම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඉහත දක්වෙන ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 07 යි)

08. දහනව වන සියවස තුළ වතු වගාවේ වර්ධනයේ ප්‍රධාන අවස්ථා පරීක්ෂා කරන්න. (ලකුණු 14 යි)


09. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
    (i) කුරුණෑගල යුගයේ සාහිත්‍ය කටයුතු (ii) කෝට්ටේ යුගයේ අධ්‍යාපනය
    (iii) සීතාවක රාජ්‍යයේ නැගීම. (iv) යාපන රාජ්‍යයේ බිඳ වැටීම. (එක් කොටසකට ලකුණු 07 බැගින්)

10. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳ කෙටි ඓතිහාසික සටහන් ලියන්න.
    (i) ජම්බුකෝළ පට්ටන (ii) මහානාගහුල
    (iii) තුරුළු වැව (iv) දදුරු ඔය
    (v) කොළඹ (vi) කොට්ටියාරම
    (vii) ගන්නොරුව (viii) සීතාවක
    (නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 1 බැගින්. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගින්.)

පැරණි ප්‍රශ්නපත්‍ර සංරක්ෂණ ව්‍යාපෘතිය නොමිලේ බෙදාහැරීම පිණිස පමණි
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

ප්‍රශ්න අංකය 10

විභාග අංකය.......................................................




WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library